# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2363/74 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියමය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා සංශෝධන අනුව 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි පරිපාලනය හා වෙනත් යම් අවැසි කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා සහ අදාළ නිලවරණයන් කැඳවීමට හා පැවැත්වීමටත් 2023 දෙසැම්බර් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන මහාචාර්ය (රියර් අද්මිරාල්) ෂේමාල් ප්‍රනාන්දු නිසි බලධාරියා ලෙස මෙයින් පත් කරමි.

01. ශ්‍රී ලංකා දුනු ශිල්ප සංගමය

02. ශ්‍රී ලංකා කබඩි සම්මේලනය

03. ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය

04. ශ්‍රී ලංකා බ්‍රිජ් සම්මේලනය

05. ශ්‍රී ලංකා ජාතික රෝද සපත්තු සංගමය

**හරීන් ප්‍රනාන්දු** (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 21 වැනි දින.

EOG 12 - 0351


1A - G 41101 — 09 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*